# කොරියා රාජ්‍යයේ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක්

අයි. වී. නිසංසලා පතිරණ

Education is one of the measuring points of a country's growth and development. Korea is considered a developed country in the world and it has a developed education system as well. On the other hand, Sri Lanka has also possessed an effective education system. In making the system better, Sri Lanka can involve the techniques of education followed in South Korea. This paper offers an introduction to South Korean education system and explores social problems in South Korea that occurred due to their education system. The purpose of this paper is to provide an insight into the Korean education system.

© අයි. වී. නිසංසලා පතිරණ

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ,
චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
**'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

## I. කොරියාවේ අධ්‍යාපනයේ තරඟකාරී උණුසුම

කොරියාව යනු අධ්‍යාපන තරඟකාරීත්වයේ උණුසුම වැඩි ම රටකි. වර්තමානය වන විට කොරියාවේ අධ්‍යාපනයට ආරෝපණය ව පවතින්නේ මනුෂ්‍යත්වයේ වර්ධනය උදෙසා පවතින්නක් යන සාම්ප්‍රදායික අර්ථය නො ව හොඳ රැකියාවක් ලබාගැනීමට තිබිය යුතු සුදුසුකමක් යනුවෙන් හා හොඳ ආධ්‍යාපනික ආයතනයකට ඇතුළත් වීමට තිබිය යුතු හැකියාවක් යන අර්ථ යි. ඒ අනුව කොරියාවේ පවතින අධ්‍යාපන තරඟකාරිත්වය හේතුවෙන් සමාජීය ගැටලු ඇති වෙමින් පවතී. මුල් ළමාවිය අධ්‍යාපනය, ඉංග්‍රීසි අධ්‍යාපනය හා අධ්‍යාපන පෞද්ගලීකරණය යනාදියෙන් ගොඩනැගෙන තරඟකාරීත්වය කොරියා සමාජය උණුසුම් කරමින් පවතී.

කොරියාවේ පවතින අධ්‍යාපන තරඟකාරිත්වයේ උණුසුමට හේතු වන කරුණු හතරක් හඳුනාගත හැකි ය.

1. සමාජයේ උසස් නිලතලයනට පත් ව යහපත් ආර්ථික මට්ටමක් ළඟා කරගැනීමට වඩාත් සුදුසු ම මාර්ගය අධ්‍යාපනය බවට අදහසක් සමාජගත ව තිබීම.

2. ස්වභාවික පිහිටීම හා ඉඩකඩ පහසුකම් රටේ දියුණුව සඳහා බොහෝ සෙයින් උපයෝගී කරගත නො හැකි වුව ද විශේෂඥ දැනුම පදනම් ව රටේ දියුණුව සලසාගැනීමට හැකි වීම.

3. කොරියා සමාජයේ උසස් අධ්‍යාපනයක් ලැබූවනට ගරු සැලැකිලි දැක්වීම් දක්නට තිබෙන බැවින් ගරු සැලැකිලි ලැබීමේ අරමුණින් අධ්‍යාපන කටයුතුවලට යොමු වීම.

4. පවුල් ඒකකය කුඩා වීමත් සමඟ ම දරුවන් එක් අයකු හෝ දෙ දෙනකු පමණක් සිටින පවුල්වල දෙ මාපියන් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම.

මෙවැනි කරුණු පමණක් නො ව අන්‍යයන් සිදු කරන හෙයින් තමන් ද කළ යුතු යැ යි පවතින සාමාජ මත හේතු කොටගෙන ද අධ්‍යාපන තරඟකාරීත්වය තීව්‍ර වී තිබේ.

## 2. කොරියා රාජ්‍යයේ අධ්‍යාපන ක්‍රමවේදය

කොරියාවේ නවීන අධ්‍යාපන ක්‍රමවේදය 1894 දී අරම්භ වී ජපානයේ අධිපත්‍ය කාලය පසු කරමින් පැමිණ ඇත. මේ කාලයේ ආගමික කටයුතු උදෙසා ආගමික නායකයන් විසින් ජනතා සුභසාධනය උදෙසා පෞද්ගලික අධ්‍යාපන ආයතන බොහෝමයක් පිහිටුවන ලදි. ජපාන ආධිපත්‍යයෙන් මිදීමෙන් අනතුරු ව ඇමරිකා ඉගැන්වීම් ක්‍රමවේදය එහි ස්ථාපිත විය. 1960න් පසු කාලීන ව කාර්මීකරණයත් සමඟ ම බොහෝ අධ්‍යාපන ආයතන බිහි විණි.

වර්තමානය වන විට කොරියාවේ ආධ්‍යාපනික ආයතන ප්‍රධාන වශයෙන් පාසල් හා විශ්වවිද්‍යාල ලෙස වර්ග කළ හැකි ය. අධ්‍යාපනය ලබාදෙන මට්ටම අනුව ප්‍රාථමික පාසල්, ද්වීතික පාසල් හා උසස් අධ්‍යාපන පාසල් ලෙස බෙදා දැක්විය හැකි අතර ප්‍රාථමික පාසලේ වසර 6ක්, ද්වීතික පාසලේ වසර 3ක්, උසස් පාසල් වසර 3ක් හා විශ්වවිද්‍යාලයේ වසර 4ක් අධ්‍යාපනය ලැබිය යුතු ය. සැමට අධ්‍යාපනය යන තේමාව යටතේ රජයේ පාසල්වල ප්‍රාථමික හා ද්වීතික අධ්‍යාපනය නිදහස් අධ්‍යාපනයක් ලෙස නො මිලේ ලබාගත හැකි ය. එනමුත් උසස් අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය පෞද්ගලීකරණය වීම සියයට අසූවක් පමණ සිදු වී තිබේ.

සාමාන්‍යයෙන් කොරියා ජාතිකයකු වයස අවුරුදු 6 දී පෙර පාසල් අධ්‍යාපනයට යොමු වන අතර හේ පෙර පාසලේ වසර දෙකක් අධ්‍යාපනය ලබයි. වයස අවුරුදු 8 දී ප්‍රාථමික අධ්‍යාපනය ද වයස අවුරුදු 14 දී ද්වීතික අධ්‍යාපනය ද වයස අවුරුදු 17 දී උසස් අධ්‍යාපනය ද ලබා වයස අවුරුදු 20 දී විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගනී.

හොඳ ප්‍රාථමික අධ්‍යාපනයක් ලැබීමට ආපේක්ෂා කරන කොරියා ජාතිකයෝ සියයට එකක් පමණ වන පෞද්ගලික ප්‍රාථමික පාසල්වල අධ්‍යාපනය ලබති. ද්වීතික හා උසස් අධ්‍යාපනය සඳහා විශේෂිත අරමුණුවලින් යුතු පාසල් එනම්, විද්‍යාව විෂයය පිළිබඳ ව පමණක් ඉගැන්වීම් කරන පාසල්, කලා විෂයය පිළිබඳ ව පමණක්

ඉගැන්වීම් කරන පාසල්, භාෂා පිළිබඳ ව පමණක් ඉගැන්වීම් කරන පාසල් යනාදී පාසල්වලට ඇතුළත් වන අතර විශේෂයෙන් ම විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම අරමුණු කොට ඉගැන්වීම් කරන පාසල්වල ජනප්‍රියභාවය වැඩි ය. තව ද ස්වයං පාලනයක් යටතේ ස්වයං අධ්‍යයනය කටයුතුවල නිරත විය හැකි පෞද්ගලික විශ්වවිද්‍යාල ද ජනප්‍රියභාවයට පත් වෙමින් පවතී.

කෙසේ නමුත් මෙවැනි පාසල්වලට ඇතුළත් වීම පහසු කරුණක් නො වේ. සාමාන්‍යයෙන් මෙවැනි පාසල්වල අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයන් ජනප්‍රිය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන අවස්ථා බහුල ය. තව ද මෙවැනි පාසල් විදේශීය ජනප්‍රිය විශ්වවිද්‍යාලවලට තම සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කරයි. එහෙයින් මෙවැනි පාසල්වලට ඇතුළත් වීමට ඇති තරඟය අතිමහත් ය.

කොරියාවේ පාසල්වල එක් වසරක අධ්‍යයන වාර දෙකකි. එනම් වසන්ත ඍතු අධ්‍යයන වාරය හා සරත් ඍතු අධ්‍යයන වාරය යි. වසන්ත ඍතු අධ්‍යයන වාරය මාර්තු මස සිට ජූලි මස අවසානය දක්වා දිවෙන අතර ජූලි මස අවසානයේ සිට අගෝස්තු මස දක්වා ගිම්හාන ඍතු නිවාඩු කාලය වේ. වසන්ත ඍතු අධ්‍යයන වාරය සැප්තැම්බර මස ආරම්භයේ සිට දෙසැම්බර මස අග භාගය දක්වා වේ. රීත නිවාඩු කාලය දෙසැම්බර් මස අවසානයේ සිට පෙබරවාරි මස මුල් කාලය දක්වා දිවේ.

කොරියාවේ ප්‍රාථමික විද්‍යාලවල අධ්‍යයන වේලාවෙන් පසු ව පියානෝ, තයිකොන්ඩො, චිත්‍ර ආදිය ඉගැනීමට හා ඉංග්‍රීසි, විද්‍යාව, චීන අක්ෂර ආදිය ඉගැනීමට ටියුෂන් පංති සඳහා ශිෂ්‍යයන් සහභාගී වීම දැන් සාමාන්‍යකරණය වී තිබේ. ටියුෂන් පංති ගාස්තුව ආර්ථිකයට දැඩි බලපෑම් ඇති කරන බැවින් වර්තමානය වන විට පාසල් කාල වේලාවෙන් පසු ව ද පාසල් පැවැත්වෙන අතර හවස් කාලයේ දී යම් යම් වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

තව ද ඉංග්‍රිසි අධ්‍යයනය පිළිබඳ උනන්දුව ඉහළ යමින් පවතින නිසා ඉංග්‍රිසි ප්‍රාථමික පාසල්වල විෂය නිර්දේශයට ඇතළත් වී තිබේ. ඉංග්‍රීසි අධ්‍යාපන තරඟය වැඩි වීමත් සමඟ ප්‍රාථමික පාසල්වල

අධ්‍යයනය කරන ශිෂ්‍යයෝ නිවාඩු කාලයේ දී විදේශගත ව අධ්‍යයන කටයුතු සිදු කරති.

ද්විතීක අධ්‍යාපනයේ සිට අධ්‍යයනය කටයුතු සඳහා වැඩිපුර කාලයක් වෙන් කිරීමට සිදු වී තිබේ. විශේෂයෙන් ම උසස් අධ්‍යපන කටයුතු කරන ශිෂ්‍යයෝ උදේ කාලයේ 7 සහ 8 අතර පාසලට පැමිණෙන අතර සවස 5 පසු වී පාසලේ අධ්‍යයන කටයුතු නිම කරති. එනමුත් එතැන් සිට හවස් කාලයේ දී පාසලේ දී ම ස්වඅධ්‍යයන කටයුතුවල නිරත වී නිවෙස් බලා පිටත්වන්නේ රාත්‍රියේ දී ය. ඒ හේතුවෙන් කොරියා ශිෂයනට තම යහළුවන් සමග ගත කිරිමට කාලයක් නොමැති අතර යෞවන ක්‍රියාකාරකම්වල නිරත වීමට ද අවස්ථාවක් නොමැත. එහෙයින් ශිෂ්‍යයෝ පරිගණක ක්‍රීඩා, රසික හමු ආදියට යොමු වෙති.

උසස් පෙළ අධ්‍යයනයෙන් පසුව විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන කොරියා ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාලවල දී අවශ්‍ය තරමේ නිදහසක් වින්දනය කරති. මිතුරු හමු, සමාගම් පිහිටුවීම, විනෝද චාරිකා යෑම, විෂයය කටයුතු සඳහා එකතු වීම ආදිය නිදසුන් ය. එනමුත් වර්තමානය වන විට උසස් අධ්‍යාපනයෙන් පසු ව රැකියා සඳහා යොමු වීමට යාමේ දී මුහුණ දීමට සිදු වන තරඟකාරිත්වය හේතු කොටගෙන විශ්වවිද්‍යාල ශිෂ්‍යයනට ද සපුරාගත යුතු සුදුසුකම් රාශියක් පවතී. ඒ අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ විවිධ සහතික පත්‍ර ලබාගැනීමට කටයුතු කරති. සාමානයෙන් විශ්වවිද්‍යාල කාලයේ දී භාෂා අධ්‍යයනය සඳහා අවුරුද්දක් පමණ විදේශ ගත ව සිටීමත් විවිධ සුදුසුකම් සපුරාගැනීම උදෙසා විදේශ ගත වීමත් හා පිරිමි සිසුන් හමුදා පුහුණුව සඳහා යොමු වීමත් දක්නට ලැබේ. ඒ අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් වයස අවුරුදු 24 පමණ වන විට උපාධිය ලබාගන්නා අතර ශිෂ්‍යයෝ පළමු උපාධිය ලබාගැනීමට වයස අවුරුදු 27 පමණ තෙක් කාලයක් ගත කරති.

වර්තමානයේ කොරියාවේ වැඩිහිටි අධ්‍යාපනය ප්‍රචලිත වෙමින් පවතී. වැඩි වියට පත්වූ සමාජයක එක ම ආයතනයක වැඩ කිරීමේ කාලය කෙටි වන අතර තවත් රැකියාවකට සුදුසුකම් සපුරාගැනීමට කටයුතු කරමින් සිටින්නන් බොහෝමයකි.

## 3. විශ්වවිද්‍යාල ප්‍රවේශය

කොරියාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පවතින විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය ජීවිතයේ වැදගත් ම විභාගයක් ලෙස සැලැකේ. ද්විතික අධ්‍යාපනය ද ඒ සඳහා උපකාරී වන නමුත් උසස් අධ්‍යාපනය බෙහෙවින් වැදගත් වේ. උසස් අධ්‍යාපනයේ තුන් වන වසර වඩාත් තීරණාත්මක වසර ලෙස සැලැකෙන අතර ඒ වසරේ අධ්‍යාපන හදාරන සිසුන් 'උසස් පෙළ තුන්වන වසරේ රෝගය' නැමැති රෝගයට ගොදුරු වී සිටින බව කොරියි සමාජය උපහාසාත්මක ව දක්වයි. තව ද ඒ ශිෂ්‍යයන් විභාග නැමැති අපායේ ගිලී සිටින බව ද පැවැසේ.

විශ්වවිද්‍යල ප්‍රවේශයෙන් පළමු වරට අසමත් වන ශිෂ්‍යයන් දෙ වන වර හා තුන් වන වරට පෙනී සිටිමින් උත්සාහ කරන්නේ වඩාත් ජනප්‍රිය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට ය. ශක්තිමත් අන්‍යෝන්‍ය සම්බන්ධතාපවතින කොරියා සමාජයේ එක ම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරා සමාජගත වූවන් අතර වඩාත් ශක්තිමත් අන්‍යෝන්‍ය සම්බන්ධතා පවතී. අධ්‍යාපනය ලැබූ විශ්වවිද්‍යාලය අනුව තත්ත්වය, ආර්ථික වටිනාකම යනාදිය වෙනස්කම්වලට ලක් වන හෙයින් කොරියා ශිෂ්‍යයන්ගේ ජීවිතවලට විශ්වවිද්‍යාලය විශාල බලපෑමක් සිදුකරන බව කිව යුතු ය. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රවේශය වැදගත් විභාගයක් ලෙස සැලැකෙන අතර ඒ හේතුවෙන් හට ගත් සමාජීය ගැටලු ද බොහෝමයකි. විශ්වවිද්‍යාල ප්‍රවේශයේ තරගකාරීත්වය හේතු කොටගෙන රජයේ පාසල්වල අධ්‍යාපන කටයුතු සඳහා යොමුවන ශිෂ්‍යයන්ගේ ප්‍රමාණය අඩු වෙමින් පවතින අතර වඩාත් ප්‍රතිඵලදායී අධ්‍යාපනයක් උදෙසා මුදල් විශාල ලෙස වැය වන පෞද්ගලික පාසල් වෙත දරුවන් යොමු කරීමට දෙ මාපියෝ උත්සාහ දරති.

කොරියාවේ අධ්‍යාපන කටයුතුවල දී අමතර පංති ඉතාමත් අවශ්‍ය වේ. අමතර පංතිවල තනි හා කණ්ඩායම් ලෙසට ඉගැන්වීම් සිදු කෙරේ. බොහෝමයක් විශ්වවිද්‍යාල සිසුහු ප්‍රාථමික හා ද්විතීයික පාසල් සිසුනට ඉගැන්වීම කර තම අධ්‍යාප වියදම් හා එදිනෙදා වියදම් සඳහා මුදල් සපයාගනිති. කොරියාවේ පාසල් සිසුන් සියලු

දෙනා ම පාහේ අමතර පංති සඳහා සහභාගීවන තරමට කොරියාවේ අමතර පංති සංකල්පය සාමාන්‍යකරණයට ලක් ව තිබේ. තව ද අමතර පංති පවත්වන ආයතන පිහිටා ඇති ප්‍රදේශවල ඉඩකඩම් හා ජීවන වියදම් ඉහළ අගයක් ගන්නා තරමට අමතර පංති සමාජයට එල්ල කරන බලපෑම අතිමහත් ය.

විශ්වවිද්‍යල ප්‍රවේශයේ තරඟකාරීත්වය හේතු කොට ඇති වන පීඩනයට අකැමැති පුද්ගලයෝ කුඩා කලයේ දී ම විදේශගත ව අධ්‍යාපනයක් ලබාගැනීම වර්තමානය වන විට නව ප්‍රවණතාවක් බවට පත් ව තිබේ. ඒ අනුව යහපත් ආදායම් මාර්ගයක් ඇති ධනවත් දෙ මාපියෝ තම දරුවන් විදේශගත ව සිදු කරන ප්‍රාථමික අධ්‍යාපනයට මුලිකත්වය දෙති. ප්‍රාථමික අධ්‍යාපනය ලැබීම සඳහා විදේශගත වන සිසුන්ගේ වර්ධනයත් සමඟ ම කොරියාවේ තනි ව වසන පියවරුන්ගේ වර්ධනයක් ද දක්නට ලැබේ. දරුවන් විදේශගත ව සිදු කරන ප්‍රාථමික අධ්‍යාපන කටයුතු සඳහා මව ද දරුවා සමඟ ම විදේශගත වන අතර පියා ඔවුනට අවශ්‍ය කරන වියදම සපයා දීමට කොරියාවේ ම රැකියාව කරමින් තනි ව වාසය කරයි. ඔවුන් හැඳින්වීමට 'කිරෝගි අප්පා'[2] යන අන්වර්ථ නාමය සමාජ ගත වී තිබේ.

## 4. කොරියාවේ විශ්වවිද්‍යාල

කොරියාවේ විශ්වවිද්‍යාල ග්‍රාමීය හා නාගරික ලෙස බෙදා වෙන් කෙරේ. කොරියාවේ නාගරීකරණයට වැදැගත් තැනක් හිමි වන බැවින් නාගරික පරිසරයක පිහිටි විශ්වවිද්‍යාලවලට ද වැදැගත් තැනක් හිමි වේ. කොරියා රජය ග්‍රාමීය විශ්වවිද්‍යාලවලට සිසුන්ගේ ඇතුළත් වීම වැඩි කිරීමට පියවර ගන්නා නමුත් නාගරික විශ්වවිද්‍යාල කෙරේ ඇති ඇල්ම නෙන් දින වැඩි වෙමින් පවතී.

කොරියාවේ ජනප්‍රිය විශ්වවිද්‍යාල ලෙස අගනුවර වන සොවුල් නගරයේ පවතින සොවුල් විශ්වවිද්‍යාලය, කොරියා විශ්වවිද්‍යාලය, යොන්සේ විශ්වවිද්‍යාලය, ක්‍යොංහී විශ්වවිද්‍යාලය, හන්‍යන් විශ්වවිද්‍යාලය යනාදිය දැක්විය හැකි ය. එසේ ම සාඩම්බර ඉතිහාසයක් හා සාම්ප්‍රදායිකත්වයෙන් අනූන කාන්තා විශ්වවිද්‍යාල ලෙස ඊහ්වා විශ්වවිද්‍යාලයත් සුග්මොංයං විශ්වවිද්‍යාලයත් ප්‍රධාන වෙයි.

කොරියාවේ අවුරුදු හතරක් අධ්‍යයන කටයුතු කරන විශ්වවිද්‍යාල එක සීය හැත්තෑවක් ද, අවුරුදු දෙකක් අධ්‍යයන කටයුතු කරන තාක්ෂණික විශ්වවිද්‍යාල එක සීය හතළහක් ද පවතී. මීට අමතර ව ගුරුවරුන් බිහි කරන ගුරු විශ්වවිද්‍යාල, ආයතනික වැඩ උගන්වන විශ්වවිද්‍යාල, මාධ්‍ය පිළිබඳ උගන්වන විශ්වවිද්‍යාල, අන්තර්ජාලය පිළිබඳ උගන්වන විශ්වවිද්‍යාල ලෙසට විශ්වවිද්‍යාල රාශියක් පවතී. වාර හතරක් හෝ වාර හයක් අධ්‍යයන කටයුතු, පර්යේෂණ කටයුතු කරන පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යයන කටයුතු හා පර්යේෂණ කටයුතු අවසානයේ නිබන්ධනයක් ඉදිරි පත් කිරීමෙන් උපාධිය ලබාගත හැකි ය.

වර්තමානය වන විට ගෝලීයකරණයට සම්බන්ධ වෙමින් ජාත්‍යන්තර මට්ටමට ගැළපෙන විශ්වවිද්‍යාල එරට බිහි වෙමින් පවතී. විශේෂයෙන් විදේශීය ශිෂ්‍යයනට කොරියාවේ අධ්‍යයන කටයුතුවලට අවස්ථාවක් ලබාදෙමින් ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු වෙමින් පවතී. තව ද කොරියා ශිෂයනට විදේශයන්හිත්, විදේශීය ශිෂ්‍යයනට කොරියාවෙහිත් අධ්‍යයන කටයුතුවලට අවස්ථාව සලසාදෙන හුවමාරු අධ්‍යයන ක්‍රමවේදයක් ඇති කර තිබේ. ඒ අනුව විදේශීය රටවල අධ්‍යාපනය ලබාගැනීමෙන් විදේශීය භාෂා දැනුම මෙන් ම සමාජීය අද්දැකීම් බහුල ශිෂ්‍යයෝ එරට සුලබ ව දක්නට ලැබේ. ඒ අනුව බලන කල කොරියාව ආධ්‍යාපනික වශයෙන් ගෝලීයකරණයට ලක් වූ රාජ්‍යයක් ලෙස හඳුන්වාදිය හැකි ය.

## මූලාශ්‍රය නාමාවලිය

Lee Seonyi (2011) Modern Korean Culture. Seoul: hankookmunhwasa.
Lee Seonyi (2011) Today Korea. Seoul: hankookmunhwasa.
Lee Seonyi (2011) Korean history and culture. Seoul: hankookmunhwasa.
http://www.ncee.org/programs-affiliates/center-on-international-education [Accessed on 28th July, 2016].
https://en.wikipedia.org/wiki/Education_in_South_Korea, [Accessed on 28th July, 2016].
http://www.bbc.com/news/education [Accessed on 28th July, 2016].